චක්‍රලේඛ අංක : 05 /2023

WPCEC/MA 01/ චක්‍රලේඛ
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක 628 ,
ජනජය සිටි ගොඩනැගිල්ල,
8 වන මහල , නාවල පාර ,
රාජගිරිය.
2023.10 . 25

බස්නාහිර පළාතේ,
සියළුම වි.සේ.ස. සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සමූපකාර ණය දෙන සමිති,
දිස්ත්‍රික් සමූපකාර මණ්ඩල හා අනෙකුත් සියළුම ලියාපදිංචි සමූපකාර සමිති
සභාපතිවරුන් වෙත.

<u>සමූපකාර සමිති සේවකයින් තනතුරු වලට පත් කිරීම</u>

සමූපකාර සමිති,වැඩබැලීමේ හෝ රාජකාරි ඉටුකිරීමේ හෝ කොන්ත්‍රාත් පදනම හෝ යටතේ පත්කිරීමට අදාලව කොමිෂන් සභාව නිකුත් කර ඇති 2019.07.26 දිනැති අංක 09/2019 චක්‍රලේඛය වෙත අවධානය යොමු කරවමි.

02. ඉහත චක්‍රලේඛ උපදෙස් ප්‍රකාර ව වැඩබැලීමේ, රාජකාරි ඉටුකිරීමේ හා කොන්ත්‍රාත් පත්කිරීම් සම්බන්ධයෙන් සමූපකාර සමිති කටයුතු නොකරන බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වී ඇත.

03 ඒ අනුව විශේෂ අවස්ථාවන්හීදී හැර ඉදිරිපත් කරනු ලබන සියළුම ඉල්ලීම් නියමිත පත්වීම් දිනට දින 30 කට පෙරවත් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කල යුතු බවට කොමිෂන් සභාව තීරණය කර ඇත.එසේ නොමැතිව සමිති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරන වැඩබැලීමේ හෝ රාජකාරි ඉටුකිරීමේ හෝ කොන්ත්‍රාත් පත්වීමක් සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය නොලැබුනහොත් එකී පත්වීමට අදාලව සිදුකර ඇති සියළු වැටුප් හා දීමනා අදාල සමිතියේ සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය පෞද්ගලික මුදල් වලින් දැරිය යුතු බවටත් එකී පත්වීම හේතුවෙන් දැරීමට සිදුවන අනෙකුත් සියළු වගකීම් ද සමිතියේ සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරෙන බවටත්, කොමිෂන් සභාව වැඩිදුරටත් තීරණය කර ඇත.

එස්.ජේ.ජයසිංහ
ලේකම්
සමූපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත

පිටපත් :
1. ලේකම් පළාත් මාර්ග ප්‍රවාහන සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප. )- කා.දැ.ගැ.පි.
2. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ත්‍රාර් (බ.ප.) - කා.දැ.ගැ.පි.